ජනජීවන අධ්‍යයනයෙහි ලා ජනකතාවෙන් සැපයෙන පිටුබලයඃ ජනකතාවල අන්තර්ගත සත්ත්ව චරිත ආශ්‍රිත විමර්ශනයක්

(හෙන්රි පාකර් විසින් සංගෘහීත Village Folk Tales of Ceylon කෘතියෙහි සිංහල පරිවර්තනය වන ලංකාවේ ගැමි ජනකතා - දෙවන වෙළුමෙහි අන්තර්ගත තෝරා ගැනුණු ජනකතා කිහිපයක් ආශ්‍රයෙන්)

S. Ihalagama

Abstract

Folktale is a prominent feature of folklore. It is the art of storytelling that has been the medium of dissemination of folklore in traditional societies. The art of storytelling, which used to be a means of information communication and entertainment with the participation of both the storyteller and the listener, is disappearing from today's society. Folktales endowed by this art are not instant creations, but stories with historical information, various types of characters, trees, and animal characters as themes. Animal characters were a significant tool used by classical writers and folktale writers in their literary creations to portray extremely complex human characteristics in a realistic and attractive manner. As a result, animal characters can be seen widely in classical literatures such as the "*Pansiya Panas Jathala Poth Wahanse*" (The Five Hundred and Fifty Jataka Tales) and in folklore elements such as folk poems, folk sayings, proverbs and folktales. The main objective of this research is to discuss the significant skill of the storytellers of the ancient traditional society, where there was no advanced communication media like the present day, to enter into the folktales the various shapes of the complex characteristics of both the 'rulers and the ruled' and the daily social activities. For this purpose, the information was collected from the "*Lankave Janakatha"* compiled by Chandra Sri Ranasinghe. This book is the Sinhala translation of the "Village Folktales of Sri Lanka" written by Henry Parker, a British irrigation official who is the pioneer of collecting folktales in Sri Lanka. The qualitative research method is used for analyzing information.The conclusions of this research indicates that the folktale creators have a strong rânge of skills to analyze various personal traits and behaviors such as guile, love, deprivation, ingratitude, apathy, and extremism of men and women by using animal characters without provokîng the listener's fêelings and (2) accordingly, folktales with themes of animal characters such as quadrupeds, birds and reptiles can be used as an effective source for the study of folk life.

Keywords: Forktail, folklife study, animal characters, human behaviors

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

සාරාංශය

ජනකතාව ජනශ්‍රැතියට අයත් ප්‍රමුඛාංගයකි. සාම්ප්‍රදායික ජනසමාජවල ජනකතාව ව්‍යාප්ත කිරීමේ වාහකය වූයේ කතාන්දර කීමේ කලාවයි. කතාන්දර කියන්නා (Storyteller) සහ ශ්‍රෝතෲන් යන (Listeners) දෙපාර්ශ්වයේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වූ තොරතුරු සන්නිවේදන මාධ්‍යයක් මෙන් ම විනෝදාස්වාදන මාධ්‍යයක් ද වූ කතාන්දර කීමේ කලාව වර්තමාන සමාජයෙන් වියැකී යමින් පවතී. මේ කලාව මගින් දායාද වී ඇති ජනකතා ක්ෂණිකෝත්පාදන නිර්මාණ නොව ඓතිහාසික තොරතුරු, විවිධ මාදිලියේ පුද්ගල චරිත, වෘක්ෂලතා මෙන් ම සත්ත්ව චරිත ද තේමා වී නිර්මාණය වී තිබෙනු දැකිය හැකි ය. අතිශය සංකීර්ණ මානව ගතිලක්ෂණ තාත්වික ආකාරයෙනුත් ආකර්ෂණීය ආකාරයෙනුත් සාකච්ඡා කිරීම්වස් සම්භාව්‍ය සාහිත්‍යකරුවන් මෙන් ම ජනසාහිත්‍යකරුවන්ද සිය නිර්මාණකරණයේදී යොදා ගත් ප්‍රබල මෙවලමක් වූයේ සත්ත්ව චරිත ය. පන්සිය පණස් ජාතක පොත් වහන්සේ ඇතුළු සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලත් ජනකවි, ජනකියමන්, ප්‍රස්තාව පිරුළු සහ ජනකතා වැනි ජනශ්‍රැති අංගවලත් සත්ත්ව චරිත බහුලව හමුවන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වර්තමානයේ මෙන් සන්නිවේදන මාධ්‍ය බහුල නොවූ පැරණි සමාජයේ වුසූ ජනකතා රචකයන් විසින් එදිනෙදා සමාජ ක්‍රියාකාරකම් මෙන් ම පාලක-පාලිත දෙපාර්ශ්වය නියෝජනය කරන ස්ත්‍රී-පුරුෂයන්ගේ සංකීර්ණ ගතිලක්ෂණවල විවිධ ස්වරූපයේ හැඩතල ජනකතාවලට ප්‍රවිෂ්ට කරවීමට දක්වන ලද බුහුටිකමත් ඒ ඔස්සේ සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජනජීවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමට සැපයෙන පිටුබලයත් කෙබඳු ද යන්න සාකච්ඡා කිරීම මේ පර්යේෂණයේ මුඛ්‍යාධ්‍යාශය වේ. මේ කාර්යයේ දී දත්ත සම්පාදනය කර ගැනුණේ ශ්‍රී ලංකාවේ ජනකතා සංගෘහීත කිරීමේ කාර්යයේ පුරෝගාමියා වන වාරිමාර්ග නිලධාරියකු වශයෙන් කටයුතු කළ බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි පාකර්ගේ Village Folk Tales of Ceylon නමැති කෘතියේ දෙවන කාණ්ඩය වශයෙන් චන්ද්‍රශ්‍රී රණසිංහ විසින් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ලංකාවේ ගැමි ජනකතා නමැති කෘතියෙන් තෝරා ගැනුණු ජනකතා කිහිපයකිනි. දත්ත රැස් කිරීම මෙන් ම විශ්ලේෂණය කිරීම සඳහාත් උපයෝගී කර ගැනුණේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. ජනකතා නිර්මාණයේදී සත්ත්ව චරිත යොදා ගනිමින් මානව ප්‍රජාවට අයත් වන ස්ත්‍රී-පුරුෂයන් සතුව පවතින සටකපටකම්, ප්‍රේමය, විරහව, අකෘතඥභාවය, අමනෝඥභාවය, අන්තගාමී ස්වරූපය බඳු විවිධ පුද්ගල ගති ලක්ෂණ හා චර්යාවන් පිළිබඳ ව ශ්‍රෝතෲන්ගේ භාව ප්‍රකෝප නොකෙරෙන ආකාරයට අතිශය සියුම් ව විශ්ලේෂණය කර දැක්වීමට ජනකතා රචකයන් දැක් වූ කුසලතාව ප්‍රබල පරාසයක පවතින බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් සිවුපා, පක්ෂි සහ උරග ආදි සත්ත්ව චරිත තේමා කර ගැනුණු ජනකතා ඵලදායක මූලාශ්‍රයයක් ලෙස ජනජීවන අධ්‍යයනය සඳහා භාවිත කළ හැකි බවත් මේ පර්යේෂණයෙන් නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද : ජනකතාව, ජනජීවන අධ්‍යයනය, සත්ත්ව චරිත, මානව චර්යාවන්

1. හැඳින්වීම

කිසියම් සමාජයකට අයත් ජනතාව සම්ප්‍රදායානුකූලව දැනුම ලබාගත් ආකාරය නැතහොත් චිරන්තන ජනයා සංස්කාතිය පවත්වාගෙන ගිය ආකාරය පිළිබඳ අධ්‍යයනය කළ හැකි විශ්වසනීය මූලාශ්‍රයක් වන ජනශ්‍රැතිය[1] මහා ගංගාවකට උපමා කළහොත් එය පෝෂණය කරන පුරාණෝක්ති, ජනප්‍රවාද, උපමා කතා, ජන ගී, ජන කවි ආදි සෙසු අතු ගංගා ආදිය අතුරින් ජනකතාව නම් අතු ගංගාවට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි[2]. ඒ, එමගින් කිසියම් රටක හෝ සමාජයක හෝ සංස්කෘතික සම්ප්‍රදායන්හි පාර්ශ්වයක් නියෝජනය කෙරෙන බැවිනි[3].

දුරාතීතයකට දිව යන ලිඛිත සාහිත්‍යයක් නොමැති ජනසමාජවල ජනශ්‍රැති මූලාශ්‍රය ආශ්‍රයෙන් විවිධ සමාජ-සංස්කෘතීන්හි සම්භවය හා විකාසනය පිළිබඳ ව තොරතුරු එක්රැස් කරගත හැකි බැවින්[4] එහි ප්‍රමුඛාංගයක් වන ජනකතාව වර්තමාන ලෝකයේ විද්‍යාව යනුවෙන් හැඳින්වෙන දැනුම් සම්භාරයේත් කලාව යනුවෙන් හැඳින්වෙන දැනුම් සම්භාරයේත් මෙන් ම සාහිත්‍යය යනුවෙන් පවසන ජනවින්දන මාර්ගවලත් මුල් බීජය ද වන්නේ ය[5]. කතාන්දර කීම වූකලී කිසියම් ඉතිහාසයක් සහිත ජන සමාජයක සෑම යුගයක ම සෑම ජන කණ්ඩායමක් අතර ම සහජ බුද්ධියෙන් රෝපණය වී ව්‍යාප්ත වූ අපූර්ව කලාවකි[6]. මේ අනුව පෙර-අපර දෙදිග සෑම රටක ම පාහේ ජනතාව අතර ජනප්‍රිය භාවිතයක් වූ ජනකතාව මඟින් මානව ජීවිතයත් මානව සමාජය හා තදනුබද්ධ ජනජීවනය පිළිබඳ සත්‍ය තොරතුරුත් ගවේෂණය කිරීමට නොමඳ පිටුබලයක් සැපයේ.

සිංහල ජනශ්‍රැතිය හැදෑරීම නම් කෘතිය සම්පාදනය කරමින් ජනජීවන අධ්‍යයනය සම්බන්ධයෙන් අදහස් දක්වන ජනශ්‍රැති පර්යේෂකයකු වන අමරදාස වීරසිංහට අනුව, "සාහිත්‍යය, ඉතිහාසය වැනි විෂයයන්ට වඩා ජනජීවනය හැදෑරීමෙන් එවේලේ ඵලප්‍රයෝජන ද අපට නෙළිය හැකි ය. මක්නිසාද? යත් සාහිත්‍යය, ඉතිහාසය වැනි විෂය මතිමතමූල ශික්ෂණ ගණයට බර වන අතර ජනජීවනය ජීවමාන භෞතික වස්තූන් සම්බන්ධයෙන් කෙරෙන වස්තුවාචක ශික්ෂණ ගණයට බර වෙයි"[7]. මේ අනුව, වස්තුවාචක ශික්ෂණ ආශ්‍රයෙන් එදිනෙදා තාත්වික ලෝකයට අයත් දේ අධ්‍යයනය කළ හැකි බැවින් සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජනජීවනයේ අව්‍යාජ පැතිකඩ ගණනාවක් ජනකතා විශ්ලේෂණය කර බැලීමෙන් අධ්‍යයනය කළ හැකි ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

1. Sanker, Sengupta., (1963). *Folklore Research in India*. Reception Committee of all Indian Folklore Confernces, p.25
2. *ලංකාවේ ගැමි ජනකතා පළමු වන වෙළුම* - දෙවන මුද්‍රණය (2014), පරිවර්තක: චන්ද්‍ර ශ්‍රී රණසිංහ, ගොඩගේ: කොළඹ
3. Bascom, William., (1965). *The Forms of Folklore; prose Narratives*. The Journal of American Folklore. Vol.78, No. 307(Jan-Mar), p.12
4. *Anthrpological Approaches* to the Study of Religion., (1969), Editer: Micheal Banton, Tavistock Publications: London, p. 06
5. තුන්දෙණිය, එච්. එම්. එස්., (2000). *හෙළ ජනකතා.* මහරගම. තරංජී ප්‍රින්ටර්ස්. p.ix
6. Eugenio, Damiana L., (1985). Phillippine Folktales: *An Introduction. Asian Folklore Studies.* Vol.44, No. 02, Published by Asian Folklore Studies: Nanzan University, p. 155
7. වීරසිංහ, අමරදාස., (1986). *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම.* සංස්කෘති ප්‍රකාශනය. ගල්කිස්ස, 78 පිටුව

2. පර්යේෂණ ක්‍රමවේදය

මේ පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ම පාදක කර ගැනෙන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qualitative Methed) යි. මේ සඳහා දත්ත රැස්කෙරෙන ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ හෙන්රි පාකර් විසින් සංගෘහීත; **Village Folk Tales of Ceylon** නමැති කෘතිය ආශ්‍රයෙන් චන්ද්‍ර ශ්‍රී රණසිංහ විසින් සිංහල භාෂාවට පරිවර්තනය කෙරුණු ලංකාවේ ගැමි ජනකතා - දෙවන වෙළුම ය. දත්ත විශ්ලේෂණය කිරීමේ දී කෘත්‍යවාධිදී ප්‍රවේශයකින් යුක්ත ව අදාළ නිගමනවලට එළඹීමට ප්‍රයත්න දැරිණි.

3. සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලාංකේය ජනකතාවල අන්තර්ගතයෙන් උකහාගත හැකි කරුණු පිළිබඳ ව ගැඹුරු හා විධිමත් අධ්‍යයනයන්හි නිරත වූ පර්යේෂකයෝ දුර්ලභයහ; බොහොමයක් ජනශ්‍රැති පර්යේෂකයන් විසින් සිදුකරනු ලැබ ඇත්තේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත ව පැවති ජනකතා, කෘති වශයෙන් සංගෘහීත කිරීම පමණි. ගුණරත්න, ඒ. පී. (2005,) රන්කැකිර සහ තවත් කතා, ගුණසෝම, ගුණසේකර (2002) බිබිලේ ජනකතා, දනන්සූරිය, ජිනදාස (2002) ජනශ්‍රැති අධ්‍යයන, දුනුමාල, මහානාම (2003) තුන් කෝරළයේ ජන කතා, උඩවත්ත, පියදාස (2004) වැව්ගම්පත්තුවේ ජනකතා, කුමාරසිංහ, සරත්චන්ද්‍ර (2004) දේවමැදිහත්පත්තුවේ ජනකතා, ගුණරත්න, ඒ. පී. (2005,) නගුල් මුන්නා සහ තවත් කතා, කරුණාරත්න ආර්. එස්. (2012) ලක්දිව ගැමි ජනකතා යනු ඉන් කිහිපයකි. මහාචාර්ය ජිනදාස දනන්සූරිය විසින් සම්පාදිත ජනශ්‍රැති අධ්‍යයන (2002) යන ලිපි එකතුවෙහි ඇතුළත් වන *ජනකතාව හා ජන ජීවිතය* යන ශීර්ෂයෙන් යුතු ලිපියෙහි ජනකතා උපයෝගී කරගෙන සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජන ජීවන වෘත්තීන්, ආහාර-පාන, ඇඳුම්-පැළඳුම් සහ නිවාසස්ථාන පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තිබේ. මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු විසින් රචිත ජනශ්‍රැතිය, පුරාකථාව සහ පුරාවෘත්තය නමැති ලිපි එකතුවෙහි (2005) *පුරාවෘත්තයේ සහ පුරාකථාවේ සුසංයෝගය* මැයෙන් අන්තර්ගත ලිපියෙහි පුරාකථා සහ පුරාවෘත්ත යන ජනකතා ප්‍රභේදද්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් ඉදිරිපත් කර තිබේ. ඒ හැරෙන්නට ජනකතාවන්හි අන්තර්ගතය විශ්ලේෂණය කරමින් ජනජීවන අධ්‍යයන සිදු කළ ප්‍රාමාණික පර්යේෂණ නොමැති තරම් ය. වීරසිංහ, අමරදාස (1986) සිංහල ජනශ්‍රැතිය හැදෑරීම සහ රත්නපාල, නන්දසේන (1995) ජනශ්‍රැති විද්‍යාව යන කෘතිවල ජනකතා පිළිබඳ හැඳින්වීම් සහ ඒවායෙහි විවිධ ප්‍රභේද පිළිබඳ ව සාකච්ඡා කර තිබේ. මේ සියලු පර්යේෂකයන් සහ මේ සාහිත්‍ය විමර්ශනයෙහි ඇතුළත් කර නොමැති ජනකතා එකතු සම්පාදනය කර තිබෙන අවශේෂ පර්යේෂකයන් ස්වකීය පර්යේෂණ කාර්යයන් සඳහා උපයෝගී කරගෙන ඇත්තේ හෙන්රි පාකර් විසින් මහාපරිමාණ වශයෙන් සංගෘහීත කරන ලද ජනකතා ය.

ක්‍රිස්තු වර්ෂ 1849 එංගලන්තයේ දී උපත ලද හෙන්රි පාකර්, 1873 වර්ෂයේ දී ලංකාවට පැමිණෙන්නේ වාරිමාර්ග නිලධාරියකු වශයෙනි. වර්තමානයෙහි තරම් ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ කිරීමේ හා අධ්‍යයනය කිරීමේ විධිමත් ක්‍රමෝපායයන් නොපැවති එසමයේ හෙන්රි පාකර් විසින් මේ ජනකතා එක්රැස් කිරීමේ දී සම්පූර්ණයෙන් ම විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණ ද ඔහුට කතාව පැවසූ පුද්ගලයා,

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

ඔහු වාසය කළ ප්‍රදේශය හා ඔහු අයත් වූ කුල ස්තරය කුමක්දැයි සටහන් කරගෙන තිබුණි. කුලය බඳු සාධකයක් සඳහන් කිරීම මෙබඳු කාර්යයක දී අත්‍යවශ්‍ය අංගයක් නොවුණ ද ජනකතා එක්රැස් කිරීමට ඔහු දැරූ ප්‍රයත්නය මෙරට ජනශ්‍රැති අධ්‍යයන ක්ෂේත්‍රයේ අභිවර්ධනයකට බලපෑයේ ය. ඔහු විසින් Village Folk Tales of Ceylon නමින් සංගෘහීත කරන ලදුව, චන්ද්‍රශ්‍රී රණසිංහ විසින් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද **ලංකාවේ ගැමි ජනකතා** නමැති කෘතියෙහි දෙවන වෙළුමෙන් තෝරා ගැනුණු ජනකතා කිහිපයක් මේ අධ්‍යයනය සඳහා උපයෝගී කර ගැනිණි.

4. දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

ගැමි ජනකතා ආශ්‍රයෙන් සාම්ප්‍රදායික සිංහල සමාජයේ ජනජීවනය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී මේ ජනකතාවල අද්‍යතනයේ මෙන් දැවැන්ත කර්මාන්තපුරවල සිරවුණු මිනිස් චරිත හමුවන්නේ නැත; මිනිස් ජීවිතවලටත් වඩා වටිනාකම් ආරෝපණය කෙරුණු අධි තාක්ෂණය භාවිතයෙන් නිර්මිත භාණ්ඩ, උපකරණ හා මෙවලම් හමුවන්නේ නැත; ස්වකීය අධිපරිභෝජන අවශ්‍යතා සපුරාගැනීම් වස් සත්ත්ව හා ශාක ප්‍රජාව වනසන ආත්මාර්ථකාමී දුෂ්ට චරිත හමු වන්නේ නැත; මිල මුදලට හා බලයට මානුෂීය ගුණධර්ම යටපත් වූ අමනෝඥ චරිත හමුවන්නේ නැත. ඒවායෙන් අපට හමුවන්නේ සුදු, කළු සහ පැතලි ස්වරූපයේ ගතිලක්ෂණවලින් සමන්විත මානව සංවේදීතාවෙන් යුක්ත චරිත ය. මනුෂ්‍ය, සත්ත්ව හා ශාක යන ප්‍රජාවන්ගේ අන්‍යෝන්‍ය සබැඳියාව ඒ චරිතවලින් මැනවින් නිරූපණය වන්නේ ය. ඒ මගින් සාම්ප්‍රදායික සිංහල ගැමියන්ගේ ජනජීවනයේ විවිධ විෂයක පැතිකඩ හඳුනාගත හැකිවන්නේ එබැවිනි.

ශ්‍රී ලාංකේය ජනකතාවල අන්තර්ගත වන චරිත පිළිබඳ ව විශ්ලේෂණය කර බලන විට මානව චරිත, සත්ත්ව චරිත මෙන් ම ජීවත්වාරෝපිත වෘක්ෂලතාදිය ද දේව, බ්‍රහ්ම, යක්ෂ-ප්‍රේත-පිශාචාදී අදෘශ්‍යමාන චරිත ද වේ. ජනකතාවල අන්තර්ගත සත්ත්ව චරිත පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී දේශීය සම්භවයක් සහිත සත්ත්ව චරිත මෙන් ම සත්ත්ව චරිත නිරූපණය කෙරෙන කතාන්දර බොහොමයක් භාරතයෙන් ආ කතා ඇසුරින් ගොඩනගා ඇති බැවින්[8] විදේශීය සම්භවයක් සහිත සත්ත්ව චරිත ද ජනකතාවලට පිවිස ඇත. සිවුපා, උරග හා පක්ෂි යන සත්ත්ව ප්‍රභේද හැමෙකකට ම අයත් ඒ සත්ත්ව චරිත මිනිසුන්ට හිතකර මෙන් ම හානිකර ස්වරූපයෙන් ජනජීවිතය හා සම්බන්ධ වන ආකාරයත් ඒ හැම චරිතයක් මගින් ම මානව ගතිලක්ෂණ නිරූපණය කරන ආකාරයත් හැඳිනගත හැකි ය.

දුරාතීතයේ සිට මේ දක්වා ම ශ්‍රී ලාංකිකයෝ අලි-ඇතුන් සමග දෘඪතර සබඳතාවක් පවත්වාගෙන එති. අලියාගේ සහ ඇතාගේ අතිවිශාල ශරීරයත්, ඊට අනුරූප වූ තෙදවත් ගමන් විලාසයත් මෙන් ම අසහාය ශක්තියත් ජනයාගේ ආකර්ෂණයට හේතු විය[9].

8. චන්ද්‍ර ශ්‍රී රණසිහ., (2014). *ලංකාවේ ගැමි ජනකතා පළමු වන වෙළුම* - දෙවන මුද්‍රණය, පරිවර්තක. කොළඹ. පෙරවදන ගොඩගේ.
9. ආනන්ද, සුනිල්, පී. ඒ., (2000). *සිංහල ජනශ්‍රැතිය හා සත්ත්ව ලෝකය*. කොළඹ. පිටුව 56 ගොඩගේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

ගෘහාශ්‍රිත වාසය ඇති හීලෑ අලි-ඇතුන්ගෙන් ජනයාට අත් වූ ලාබ ප්‍රයෝජන මෙන් ම වනවාසී අලි සහ ඇතුන්ගෙන් එල්ල වූ තාඩන-පීඩන ආදියෙහි ස්වභාවය අනුව අලි ඇතුන් කෙරෙහි ජනතාව දැක්වූ ආකල්ප විවිධ විය. කෙසේ වෙතත් අලි ඇතුන්ගේ විශාලත්වය, ජවසම්පන්නභාවය හා ශරීරබර ප්‍රමාණය සැලකිල්ලට භාජන කරමින් මානව ගතිලක්ෂණ නිරූපණය කිරීම සඳහා ජනකතාවලට ඔවුන්ගේ චරිත උපයෝගී කරගෙන ඇත. විශේෂයෙන් ම අතිවිශාල බරක් ප්‍රමාණ කිරීමට භාවිත කළ මිණුම් ක්‍රමයක් වූයේ 'ඇත් බර' ය.

අතීතයේ රජවරුන් විසින් ඇතෙක් බරට වස්තු ප්‍රදානය කරන ලද අවස්ථා පිළිබඳ ව ජනකතාවල පමණක් නොව විදග්ධ සාහිත්‍යයේ පවා සඳහන් වේ. අතීතයේ රජවරු තමන්ට හෝ තම අමාත්‍ය මණ්ඩලයට හෝ විසඳාගැනීමට දුෂ්කර වූ ප්‍රශ්නයක් විසඳා දුන් හෝ දුෂ්කර කාර්යයක් මස්තකප්‍රාප්ත කර දුන් පුද්ගලයන්ට තරාතිරමක් නොබලා 'ඇතෙක් බරට' වස්තුව ප්‍රදානය කිරීමේ සම්ප්‍රදායක් පැවතිණි. සාමාන්‍ය ජනතාව අතුරින් ප්‍රඥාවන්ත හා විශිෂ්ට කුසලතා හා දක්ෂතා සහිත තැනැත්තන්ට ස්වකීය කුසලතා විදහා පෙන්වමින් අති විශාල වස්තු සම්භාරයක් අත්පත් කරගැනීමට මෙයින් ඉඩ ප්‍රස්තාව සැලසිණි. එහෙත් ඇතැම් විට කූට උපක්‍රමවලින් රජුගේ අවශ්‍යතාව ඉෂ්ට කර වස්තු ප්‍රදාන ලබාගත් කපටි පුද්ගලයන්ට ඔවුන්ගේ කපටිකම් හෙළි වීමෙන් ඊට මරණීය දණ්ඩනය පවා හිමි වූ ආකාරයත් ඇතැම් ජනකතාවලින් කියැවේ. **ලංකාවේ ගැමි ජනකතා - දෙවන වෙළුමෙහි** (ලං. ගැ. ජ.-2) අන්තර්ගත වන 'රාජකුමාරයා සහ වඩුවාගේ පුතා' නමැති කතාන්දරයේ ළිඳක් ඇතුළත සිටි කුමාරිකාවක එයින් ගොඩ ගැනීමට අවශ්‍ය වී එය තමන්ට ඉෂ්ට කර ගැනීමට නොහැකි වූ නිසා රජතුමා, "කවුරු හරි කෙනෙක් අහවල් වනාන්තරයේ තියෙන ළිඳේ ඉන්න කුමාරිකාව තමාට ගෙනැවිත් දුන්නොත් ඔහුට ඇතෙක් බරට වස්තුවත් රටෙන් බාගයකුත් දෙවන බවට අණබෙර මඟින් දන්වා හිටිය"[10]. මේ පුවත සැලවීමෙන් පසු වැන්දඹු කාන්තාවක් ඒ ළිඳේ සිටි කුමරිය කූට උපක්‍රමයකින් ගොඩට ගෙන රජුගෙන් වස්තුව ලබා ගත්තා ය. එහෙත් ඒ කුමරිය විවාහ කරගත් රාජකුමාරයා ඒ කාන්තාවගේ වංචාසහගත ක්‍රියාව දැනගෙන ඇගේ හිස ගසා දැමී ය. මේ අනුව, අතිවිශාල වස්තු සම්භාරයක් ප්‍රමාණ කොට දැක්වීමේ මිණුම් ක්‍රමයක් වූ ඇතෙක් බරට වස්තුව පිළිබඳව ගැමියන් ඇති කරගෙන තිබූ සංකල්පයේ පැතිකඩ දෙකක් පවතින බව මේ ජනකතාව අනුසාරයෙන් හඳුනාගත හැකි ය.

සිංහයා මෙරටට ආවේණික සත්ත්ව විශේෂයක් වශයෙන් නොසැලකුණ ද සිංහයාගෙන් වියුක්ත වූ සිංහල ජාතියක් නොමැති තරම් ය. පුරාවෘත්ත හා වංශකතාවලට අනුව මෙරට සිංහල වර්ගයා ආරම්භ වී ඇත්තේ භාරත දේශයෙන් මෙරටට පිටුවහල් කෙරුණු විජයගෙනි. ඔහුගේ පියරජුගේ පියා ජන්මය ලබා ඇත්තේ සිංහයකු හා රජ කුමරියක අතර කායික සම්බන්ධයකින් බව පුරාවෘත්තවල සඳහන් ය.

10. ලංකාවේ ගැමි ජනකතා - දෙවන වෙළුම - (ලං.ගැ.ජ.-2) (2012), පරිවර්තකඃ චන්ද්‍රශ්‍රී රණසිංහ, ගොඩගේඃ කොළඹ, 26 පිටුව

ඒ අනුව සිංහල වර්ගයාට 'සිංහල' යන නම ලැබීමට සිංහයා හේතු වී ඇති සේ ම ශ්‍රී ලාංකේය කලාශිල්ප විචිත්‍රත්වයෙන් මෙන් ම ප්‍රෞඪත්වයෙන් පෝෂණය කිරීම සඳහා ද සිංහයාගේ දායකත්වය ලබාගෙන ඇති ආකාරයට සීගිරියේ සිංහපාදය හා විහාරස්ථාන ප්‍රවේශාභිමුඛ ව පවතින සඳකඩපහණ කදිම නිදසුන් සපයන්නේ ය. සිංහල ජන මනසෙහි සිංහයා පිළිබඳව ගොඩනැගී පැවති සංකල්ප විදග්ධ සාහිත්‍ය - කලාදියට මෙන් ම ජනසාහිත්‍යයට ද බලපෑම් සිදුකරන සාධකයක් වී ඇත.

ජනකතාවල සත්ත්ව චරිත අතරට ද සිංහයා පිවිස ඇත්තේ ඒ අනුව ය. 'උගත් දිළින්දා' නමැති ජනකතාවේ අම්බලමකදී හමු වූ දිළිඳු මිනිසුන් දෙදෙනෙකු අතුරින් එක් අයෙක් අනෙකාගේ උපදෙස් පරිදි රජවාසලට ගොස් රජතුමා විසින් පවරනු ලබන සටන් කිරීම්, අණබෙරලෑම් වැනි කාර්යවලට සහාය ලබාදිය හැකි බව පවසා ජීවත්වීමට රජතුමාගෙන් වේතනයක් ඉල්ලා සිටියේ ය. රජතුමා ද ඔහුට ඉටුකළ හැකි කාර්යයන් පිළිබඳ විමසා සන්තෝෂයට පත් ව රජවාසලින් ඔහුට වැටුපක් ගෙවීමට අනුමත කෙළේ ය. ඒ වැටුපෙන් හරි අඩක් අම්බලමේදී මුණගැසී තමාට මඟ පෙන්වූ අනෙක් පුද්ගලයාට ලබා දුන් හේ තමාගේ ගම්පළාතට ගොස් වාසය කෙළේ ය. 'හේරිනාදයා' යන විශේෂිත නාමය ද ඔහුට පටබැඳී තිබුණේ ඔහු සතුව පැවති අණබෙර වැයීමේ හැකියාව නිසා ය. මේ පුද්ගලයා තම වැටුප ලබා ගැනීමට නියමිත දිනයේ දී රජවාසලට පැමිණි අවස්ථාවක, නගරයේ සිටින මිනිසුන්ට හානිකර වූ සිංහයකු මැරීමට රජතුමා විසින් පළපුරුදු ඇමතිවරුන් පිටත් කර හරින ලද පුවත අම්බලමේ දී තම සගයාගෙන් දැනගත්තේ ය. පසුව සගයාගේ උපදෙස් පරිදි රැහැනක් ගෙන එය බෙල්ල වටේ ඔතාගෙන සිංහයා මරාගෙන පැමිණෙන පුද්ගලයාන් ඉදිරියට ගොස් මෙසේ කීය;

"උඹලා කරල තියෙන වැඩේ නම් අපූරුයි; මං මේ වාසලින් රැහැනක් ඉල්ලාගෙන ආවෙ සිංහයාව (පණපිටින්) අල්ලගෙන ගිහින් දැකුම් හැටියට රජ්ජුරුවන්ට ඔප්පු කරන්ඩයි. ඒ හින්දා ඔහෙලට බැණුම් අහන්නයි සිද්ද වෙන්නෙ"[11]. මේ කියමන අසා බියට පත් වූ මිනිස්සු "අනේ හේරිනාදයො, අපි ඌ මැරූ වගක් හෙම කියන්ඩ එපා"[12]යි හේරිනාදයාට බැගෑපත් වූහ. "මම ඒ කාරණේ මගෙ කරට අරගෙන මං කළා කියල කියන්නම්කො"[13] යි ඊට පිළිතුරු දුන් හේරිනාදයා, අනතුරුදායක වූ භයානක සිංහයා මරාදැමීම තමන්ගේ ක්‍රියාවක් බව රජතුමාට ඒත්තු ගන්වා මසුරන් දහසක මාසික වැටුපක් ලබා ගත්තේ ය. එහෙත් ඒ රැවටිල්ල දිගටම කරගෙන යාමට ඔහුට නොහැකි විය. හේරිනාදයාගේ සටකපටකම් හඳුනාගත් රජතුමා ඔහු ජීවිතක්ෂයට පත් කළේ ය.

11. ලං. ගැ. ජ.-2 -262-263 පිටු
12. ලං. ගැ. ජ.-2-263 පිටුව
13. එම-263 පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30

මිනිසුන් තුළ පවතින සටකපටකම් පිළිබඳ ව නිරාවරණය කිරීමේ දී සාහිත්‍ය නිර්මාණකරුවන් විසින් බහුලව ම නිදර්ශනය කොට ගෙන ඇති සත්ත්ව චරිතය නරියා වුව ද එවැනි මනුෂ්‍ය ස්වභාවයන් නිරූපණය කිරීමට සටකපටකම්වලින් වියුක්ත ගතිලක්ෂණ සහිත සිංහයාගේ චරිතය යොදාගෙන තිබීම 'උගත් දිළින්දා' නම් ජනකතාවේ විශේෂ ලක්ෂණයකි.

මනුෂ්‍යයාගේ සමීපයේ නිරන්තරයෙන් වෙසෙන සත්ත්ව විශේෂයක් වන්නේ සුනඛයා ය. මෙම සත්ත්වයා ද විවිධ මනුෂ්‍ය ස්වභාවයන් නිරූපණය කිරීම සඳහා ජනකතාවලට යොදාගෙන තිබේ. යුක්තිය පසිඳලීමේ වගකීම උසුලන ගම් මට්ටමේ ගමරාලගේ පටන් රජු දක්වා වූ පාලක පැළැන්තිය විසින් දෙනු ලබන හාස්‍යෝත්පාදක වුවත් තාර්කික නඩු තීන්දු පිළිබඳව කියැවෙන ජනකතා බොහෝ ය. සුනඛ චරිතයක් යොදාගෙන රජවරයකු විසින් ලබා දුන් නඩු තීන්දුවක් 'මිතුරන් හතරදෙනෙකු ගැන කතාන්දරයක්' ජනකතාවේ එයි. මේ කතාන්දරයෙන් කියැවෙන්නේ මිතුරන් සිවුදෙනෙකු විසින් පොදුවේ සුරතලයට ඇතිකරන ලද සුනඛයකු පිළිබඳවයි. මේ මිතුරන් සිව්දෙනා ඔවුන්ගේ සුරතලා ලෙස ඇති දැඩි කරන ලද සුනඛයකුගේ අයිතිය බෙදා ගත්තේ ඉදිරි පාද දෙදෙනෙකුටත් පසු පාද තවත් දෙදෙනෙකකුටත් වශයෙනි.

මේ මිතුරන් කපු හේනක් වවා, අස්වනු නෙළා, කපු පුළුන් වියලා පසෙක ගොඩ ගසා තිබුණි. මේ අතරේ සුනඛයාගේ ඉදිරිපස පාදයක හටගත් තුවාලයකට ඒ පාදයට අයිතිය කී මිතුරා විසින් පාංකඩක් තෙල්වල පොඟවා තුවාලය සහිත පාදය වෙලන ලද පසු සුනඛයා ලිප්බොක්කට ගොස් වැතිරී සිටින අතරේ තෙල් ගැල්වුණු පාංකඩයට ගිනි ඇවිළී තිබේ. ඉන් භීතියට පත් සුනඛයා ගොඩගසා තිබුණු පුළුන් ගොඩේ වැතිරීම නිසා පුළුන්වලට ගිනි ඇවිළී පිළිස්සී විනාශ වීමෙන් දුකට පත් මිතුරන් සිවුදෙනා එකිනෙකා සමග ක අවසානයේ රටේ රජු වෙතට ඔවුන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් කළහ. එහිදී විනාශ වූ පුළුන්වලින් තම-තමන්ට හිමි කොටස්වල වටිනාකම සුනඛයාගේ ඉදිරිපස පාදයෙහි අයිතිකරු වශයෙන් පෙනී සිටි තෙල් පාංකඩ බඳින ලද මිතුරාගෙන් අය කර දෙන ලෙස සෙසු මිතුරන් විසින් රජුගෙන් ඉල්ලා සිටිනු ලැබිණි. ඔවුන්ගේ තර්කය වූයේ සුනඛයාගේ පාදයේ තුවාලයට තෙල් පාංකඩ බැඳීම ගින්න හටගැනීමට හේතුව බවයි. මොවුන්ගේ කතා අසා සිටි රජු "බල්ලගෙ කැඩිච්ච අණ්ඩ ඌට බිම ගහන්න බැරි තරමට ම කැඩිල තිබුණ ද"[14] යනුවෙන් ප්‍රශ්න කෙළේ ය. මිතුරන් තිදෙනා ඊට පිළිතුරු ලබා දුන්නේ 'ඌට අණ්ඩ පොඩ්ඩක්වත් බිමගහන්න බැරිවයි හිටියේ'යනුවෙනි. මෙහි දී රජතුමා ලබා දුන් තීන්දුව වූයේ "ඌ උඹල තුන්දෙනාටම අයිති කකුල් තුනෙන් ගිය හින්දා නුඹලගෙ වැරැද්දෙන් තමා පුළුන් (ගොඩ) ගිනි අරන් තියෙන්නෙ. (ඒ හින්දා) අර තැනැත්තාට වෙච්ච අලාබෙට මුළු මුදල නුඹලා තුන්දෙනා ගෙවන්න ඕනෑ"[15] යනුවෙනි. බල්ලකු හෙවත් සුනඛයකු තේමාකර ගැනුණු මේ කතාන්දරයෙන් සන්නිවේදනය කෙරෙන සදුපදේශය වන්නේ ඇතැම් පුද්ගලයින් විසින් කිසියම් ප්‍රශ්නයකදී අන්‍යයන්ගේ අදහස්වලට සවන් නොදී නිෂ්ඵල තර්ක-විතර්ක මඟින් තම මතය ම ජයගැනීමට දරනු ලබන ප්‍රයත්නයන් නිසා තමන්ට ම අපහසුතාවට ලක්වීමට සිදුවන බව ය.

14. ලං. ගැ. ජ.-2 -128 පිටුව
15. එම- 128 පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES

සාම්ප්‍රදායික සිංහල සමාජය හා දැඩි සබඳතාවක් දක්වන සත්ත්වයකු වන්නේ ගවයා ය. කෘෂිකාර්මික කටයුතුවලදී සහ ප්‍රවාහන කටයුතුවලදී නිරන්තරයෙන් සහාය ලබාගත් ගවයා ද ජනකතාවල සුවිශේෂ චරිතයක් විය. බොහෝ ජනකතාවල ගවයා යොදාගෙන ඇත්තේ මිනිසුන්ගේ අනුවණකම් සංකේතාත්මක ව නිරූපණය කිරීමට ය. "ගැහැනියක් පිටිවලින් රූපයක් තැනූ හැටි" නමැති ජනකතාවේ ගොන් වස්සකුගේ චරිතය යොදාගෙන ඇත්තේ ස්ත්‍රියකගේ මෝඩ සොර සැමියකු සංකේතවත් කරමිනි. ස්වකීය ස්වාමි පුරුෂයන් රවටා වෙනත් පුරුෂයන් සමග සබඳතා පවත්වන විවාහක ස්ත්‍රීන් පිළිබඳ කතා පුවත් සහිත බොහෝ ජනකතා අතර මේ කතාව සුවිශේෂ ය. මේ ජනකතාවෙන් කියැවෙන්නේ දුර පළාතකින් දීග පැමිණි කාන්තාවක විසින් ස්වකීය විවාහක සැමියා රැවටීමට පත්කොට, තමා ඇසුරු කළ සොර සැමියා නිවසට ගෙන්වාගෙන ළඟින් ම තබාගෙන ඇසුරු කිරීමට දරන ලද ප්‍රයත්නයක් පිළිබඳව යි. "අපේ පළාතේ එක සිරිතක් තියෙනවා. (ඒක තමා) පිටිවලින් රූපයක් හදල, ඒක ලිප ළඟ පුටුවක් උඩින් වාඩි කරවල, අපි කැවුම් උයල ඒ රූපෙට පූජා කරන්න ඕනැ"[16] යනුවෙන් තම ස්වාමිපුරුෂයාට පවසා ඔහු ලවා ම කැවුම් පිසීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගෙන පැණි රස වැඩියෙන් යෙදූ කැවුම් පිස එක හැළියකටත් පැණි රස අඩුවෙන් යෙදූ කැවුම් පිස තවත් හැළියකටත් දමන්නට වූවාය. සැමියා නිවසින් බැහැර වූ අවස්ථාවක් බලා සොර සැමියා ගෙන්වාගෙන ඔහුගෙ ශරීරය පුරා ම පිටි තවරා ලිප අසලින් පුටුවක් තබා, ඒ පුටුවේ ඔහු වාඩිකරවා මේ ආකාරයට කැවුම් පිසින අතරේ නිවසට පැමිණෙන සැමියා පුටුවේ සිටින්නේ ඇගේ සොර සැමියා බව වටහාගෙන වත්ත පහළ ගසක බැඳ සිටි භාර්යාවගේ ගමෙන් ගෙනා ගොන් වස්සා ලිහා දමා තම භාර්යාව ගොන් වස්සා ගැටගැසීමේ කාර්යය සඳහා පිටත් කර යැවී ය. ඒ අතරේ ඔහු පිටි රූපයේ හිස මතට තෙල් තාච්චිය වත් කළ විට පිටි රූපය වේදනාවෙන් ඇඹරෙන්නට විය. වස්සා බැඳ දමා ආපසු පැමිණෙන විට සිදුව ඇති දේ වටහා ගත් බිරිඳ "මං පිටි රූපෙ හදල තියල තිබුණ. අරූ (ඇවිත්) ඒක අහකට විසි කර දාල (ඒක තිබ්බ්ච තැනින්) වාඩිවෙලා හිටියා. මං (ඉතිං) මක්කා කරන්න යැ? ඒක දැකල උඹවැන් උඹ ඔච්චරවත් බේරුවා. මං (හිටියා) නම් ඕකගෙ කැවුත්ත කනවා. ඇයි ඔහෙ උගෙ ඔලු ගෙඩිය පැළුවෙ නැත්තෙ"[17]යනුවෙන් පවසා සැමියා රැවටීමට ලක් කළා ය. ජනවහරේ මෝඩ පුද්ගලයන් හැඳින්වීමට 'ගොන්වස්සා' යන්න භාවිත වන අවස්ථා පවතී. මේ කතාන්දරයේ ගොන් වස්සාගේ චරිතය උපයෝගී කරගෙන ඇත්තේ ඒ ස්ත්‍රියගේ නීත්‍යනුකූල ස්වාමිපුරුෂයා මෙන් ම සොර සැමියා ද ගොන් වස්සෙකු මෙන් මෝඩ බව සංකේතවත් කිරීමට ය.

ජනසාහිත්‍යයේ මෙන් ම සම්භාව්‍ය සාහිත්‍යයේත් හිවලා නිරූපණය කර තිබෙන්නේ කපටි කෛරාටික සත්ත්වයකු වශයෙන් ය. සිය කුට බුද්ධියෙන් අනුන් රවටා ලාබ ප්‍රයෝජන ලබන හිවල් චරිත මෙන් ම ස්වාර්ථය වෙනුවෙන් යොදන උපා අසාර්ථක වී විපතට පත්වන හිවල් චරිත ද ජනකතාවල හමු වේ.

16. එම- 242 පිටුව
17. ලං. ගැ. ජ.-2 එම- 243 පිටුව

'දුස්ට කුමාරිය' නමැති කතාන්දරයෙන් නිරූපණය කෙරෙන්නේ තම කටින් මස් කැබැල්ලක් ඩැහැගෙන ගං ඉවුරේ ගමන් කරමින් සිටින විට ගං දිය මතින් පෙනුණු මස් කැබැල්ලේ රූපයට රැවටී කටේ තිබූ මස් කැබැල්ල බිම තබා ගං දියට පැන්න පසු උකුස්සකු විසින් ඒ මස් කැබැල්ල ඩැහැගෙන යාමෙන් රැවටීමට ලක් වූ හිවලකුත් වැද්දකු හා තම ස්වාමියා අතර සටනකදී වැද්දාට ලොබ බැඳ වැද්දාගේ අතට කඩුව දීමෙන් ස්වාමියා මරණයට පත්වීමට ඉඩ සැලැස්වූ නමුත් තමා පිළිගැනීම වැද්දා ප්‍රතික්ෂේප කිරීම නිසා අසරණ වූ ස්ත්‍රියකත් පිළිබඳව ය. මෙහිදී හිවල් චරිතය සමග ස්ත්‍රී චරිතය සැසඳීමක් කර හිවලාට වඩා ස්ත්‍රිය මුළාවට පත්වූ ආකාරය මේ ජනකතාවෙන් විදහා පෙන්වයි. මේ ජනකතාවේ කතා පුවත මනමේ කථාප්‍රවෘත්තියට අතිශය සමීප ය. එක්තරා රාජකුමාරයෙක් ස්වකීය භාර්යාව සමඟ කැලයක් මැදින් ගමන් කරන විට වැදි කණ්ඩායමකට හසු වී ප්‍රථමයෙන් ම කණ්ඩායමට අයත් අවශේෂ වැද්දන් සමඟ සටන් කර ජයග්‍රහණය ලබා, දෙවනුව වැදිරජු සමඟ සටන් කිරීමට සූදානම් ව තම භාර්යාවගෙන් කඩුව ඉල්ලූ විට ඇය කඩුව වැද්දාටත් කඩුකොපුව තම ස්වාමිපුරුෂයාටත් ලබාදීම හේතුවෙන් කුමාරයා මරණයට පත්වෙයි. මේ සටනින් පසුව වැද්දාටත් රාජකුමරියටත් ගඟකින් එතෙරව යාමට සිදු ව තිබිණි. කුමරියගේ අකෘතඥභාවය වටහාගත් වැද්දා කුමරියගේ ආභරණ ගඟෙන් එගොඩ තබා දෙවනුව පැමිණ ඈ ගඟමැදට කැටුව ගොස්, "මේ මුළු තුන් ලෝකෙ ම තී වගෙ දුස්ට ගැනියක් නෑ. අද (විතරක්) දැක්ක මට හිත වැටිල ගිහින්, තරුණ කාලෙදි තමන් කාරබැඳගත්ත කුමාරයාව එකපාරට ම මරා දාන්න ඕනැකමට එයාට කඩුකොපුව දුන්න ගැනි ඉන්න රටක වසන්නවත් හොඳ නෑ"[18] යි පවසමින් ඈ ගං ඉවුරේ තනිකර දමා යයි. මේ අවස්ථාවේ මස් කුට්ටියක් කටින් ඩැහැගත් හිවලකු ඒ මස් කුට්ටියේ හෙවණැල්ල ගංදියේ වැටී තිබෙනු දැක, කටේ තිබූ මස්කුට්ටිය බිමින් තබා ගඟ දියේ දිස්වුණු මස්කුට්ටිය ඩැහැගැනීමට ගඟට පනිනු දුටු උකුස්සෙකු ඒ මස්කුට්ටිය රැගෙන යයි. මෙය දුටු කුමරිය "බොල තකතීරු හිවලෝ තගෙ කටේ තිබුණු මස්කුට්ටිය පැත්තකට දාල, තෝ ගඟේ තිබුණු මස් කන්න ගියා. ඒ වැඩේ හොඳයි ද?"[19] යනුවෙන් හිවලාට සමච්චල් කරයි. ඊට නරියා ප්‍රතිඋත්තර දෙන්නේ "මගෙ තකතීරුකම වගෙ නෙමෙයි තිගෙ තකතීරුකම. මේ (රටේ) රජ්ජුරුවන් එක්ක දීගෙක ගිහින් ඉන්ද දී එවෙලෙම දැකපු වැදි රජ්ජුරුවොත් එක්ක දීගකන්න ගිහින් කන්න දෙයක්වත් අඳින්න දෙයක්වත් ඉන්න හිටින්න තැනක්වත් නැතුව දැන් තී ඔය තත්වෙට ඇදන් වැටිල ඉන්නවා. මං කළ තකතීරුකමට වඩා තකතීරුකමක් කරල තියෙන්නෙ තී නෙ"[20] යනුවෙනි. සම්භාව්‍ය සාහිත්‍ය කෘතියක් වන මනමේ නාට්‍යයේ දී මනමේ කුමරිය මුහුණදුන් සිද්ධිය ම මේ ජනකතාවේ හිවලකුගේ චරිතය යොදා ගෙන හාස්‍යෝත්පාදක ව ඉදිරිපත් කෙරෙන ආකාරය චිත්තාකර්ෂණීය ය. එසේ ම බොහෝ පුද්ගලයන් තමන් අතින් කෙතරම් විශාල වරදක් සිදුවුණත් අනුන්ගේ වැරදි විවේචනය කිරීමට පෙලඹෙන බව ද මින් විශද කෙරෙයි.

ස්වෝත්සාහයෙන් ජීවිතය සාර්ථක කරගැනීමට වෑයම් කරන පුද්ගලයන්ට උදව් උපකාර කිරීමට වඩා ඔවුන්ගේ කටයුතුවලට බාධා කිරීමට පෙලඹෙන පුද්ගලයෝ සමාජයේ බහුලව වෙසෙති. එහෙත් කුමන බාධක පැමිණිය ද ඒවා මැඩගෙන ජීවිතය සාර්ථක කරගන්නා පුද්ගලයෝ වෙති. 'කලුන්දෑවගේ කතාන්දරය' නම් ජනකතාවේ කියැවෙන්නේ එබඳු පුද්ගලයකු පිළිබඳව ය.

18. එම- 173 පිටුව
19. එම- 174 පිටුව
20. එම- 174 පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES

එක් ගමරාළ කෙනෙකුටයි ඔහුගේ බිරිඳටයි දූවරුන් හත්දෙනෙකු සිටි නමුත් පුත්‍රයකු නොසිටි හෙයින් වෙනත් මව්-පිය දෙපළකගෙන් ඉල්ලා ගත් පිරිමි දරුවකු හදා වඩාගෙන ඔහු හා විවාහ වීමට කැමති කවුරුන්දැයි දූවරුන්ගෙන් විමසූ අවස්ථාවේ 'අපිට ඒ ජරා හොරිකඩයා එපා' යයි වැඩිමහල් දූවරුන් හයදෙනා ම ඔහු ප්‍රතික්ෂේප කළ නමුත් බාල දියණිය ඔහු හා කැමැත්තෙන් ම විවාහ වෙයි. මේ තරුණයා විසින් උදැල්ලක් හදා දෙන ලෙස කම්මල් නයිදේගෙන් කරන ලද ඉල්ලීම කිහිප වතාවක් ම ප්‍රතික්ෂේප කළ නමුත් කම්මල්කරු ආහාර ගන්නා වේලාවේදී ඒ තරුණයා ඉවත ලූ යකඩ කැබැල්ලක් ගෙන ගින්දරට දමයි. එහිදී ඒ නොවටිනා යකඩ කැබැල්ල වටිනා යකඩ කැබැල්ලක් වී තිබෙනු වටහාගත් කම්මල්කරු තරුණයාට උදැල්ලක් සදා දෙයි. උදැල්ලක් ලැබුණු නමුත් සී සෑමට අවශ්‍ය මී හරක් බානක් නොමැති නිසා තවත් තැනැත්තකුගෙන් එය ඉල්ලන ලදුව හේ ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි. කිසිවෙකුටත් කිට්ටු විය නොහැකි ආකාරයට කඳු දෙකකට වැදී සිටි, ගමරාළට අයත් ව සිටි කුළු මී හරක් දෙදෙනා ගැන ඇසූ තරුණයා වියගහ තණකොළ බිස්සේ හිටවලා "මට රජකම ලැබෙනවා සත්තයි. එහෙම නම් අර කන්දෙ ඉන්න කුළාත් මේ කන්දෙ ඉන්න කුළාත් දෙන්නම හෙට උදේ ඇවිත් මේ වියගහට කරදීගෙන ඉන්න ඕනැ"[21] යනුවෙන් සත්‍යක්‍රියා කරයි. පහුවදා උදේ කුඹුරට පැමිණ බලන විට හරක් බාන වියගහට කර දී සිටි හෙයින් හේ සී සෑමෙහි නිරත වෙයි. භාර්යාව විසින් රැගෙන එනු ලැබූ ඇඹුල අනුභව කර කෙටි නින්දකට වැටුණු ඔහු, වියගසේ බඹර වදයක් බැඳ ඇති අයුරු සිහිනයෙන් දකී. නින්දෙන් අවදි වී තමා හීනෙන් දුටු දේ භාර්යාවට පැවසූ විට ඇය ප්‍රීතියට පත් වී 'එහෙනම් ඉතින් ඔහෙට දැන්ම ම රජකම කඩන් වැටේවි' යනුවෙන් පවසයි. භාර්යාවගේ අනාවැකිය සැබෑ කරමින් ඔහුට එදින ම රජකම ලැබේ. මේ අනුව මේ ජනකතාවෙන් උත්සාහය හා ධෛර්යය විසින් පුද්ගලයකු සාර්ථකත්වය කරා රැගෙන යාම පිළිබඳ පණිවුඩය සන්නිවේදනය වේ. එමෙන් ම සාම්ප්‍රදායික ජන සමාජයේ ප්‍රචලිත ව පැවති නිමිති ශාස්ත්‍රවලදී විශේෂ තැනක් ලැබී ඇති සිහින පිළිබඳ ජන විශ්වාසය ද පෙන්නුම් කෙරේ. සිහිනයෙන් දකින සත්ත්ව වර්ග අනුව සුබ අසුබ බව සලකා බැලීමේදී සුබ නිමිති පෙන්වන සත්ත්වයන් අතර ගවයා සහ බඹරා ද වෙති. ඒ අනුව මේ ජනකතාවේ මී ගවයින් බානක් හා බඹරුන් සිහිනයෙන් දැකීම අතිශය සුබ නිමිත්තක් වූ බව ප්‍රකාශ වෙයි.

රටක ජන සමාජය සජාතීය පුද්ගලයින්ගෙන් සමන්විත ඒකකයක් නොවේ. විවිධ ජාති, කුල, ආගම්, පක්ෂ හා වෙනත් විවිධ කණ්ඩායම්වලට බෙදී ගිය පුද්ගලයෝ සමාජයක ජීවත් වෙති. එහෙත් යම්කිසි බලවත් පුද්ගලයකුගෙන් හෝ පාර්ශ්වයකින් එල්ල වන අර්බුදයකදී සියලු බෙදීම් ඉවතලා එකට එක්වූ විට කුමන තරමේ ප්‍රබලයකු වුව ද මැඩ පැවැත්විය හැකි ය යන විශ්වාසය ජනයා අතර පවතී. මේ පිළිබඳ පණිවුඩයක් ලබා දෙන ජනකතාවක් ලෙස 'කැට කිරිල්ලියගෙ කතාන්දරය' හැඳිනගත හැකි යි. මේ කතාවෙන් ප්‍රකාශ වන්නේ එක්තරා කැටකිරිල්ලියක විසින් රකිමින් සිටින ලද බිත්තර පාගා පොඩිකර දැමූ ඇතෙකුට ඈ විසින් දඬුවම් ලබා දෙනු ලැබෙන ආකාරය යි. ඇතාගේ ක්‍රියාකලාපය හේතුවෙන් වේදනාවට පත් කැටකිරිල්ල ගෙම්බෙකු, කපුටෙකු හා මී මැස්සෙකු වෙත ගොස් ඈ ආදරෙන් රකිමින් සිටි බිජු දෙක පාගලා පොඩිකරල දාපු ඇතා මරාදමන්න උදව්-උපකාර ඉල්ලුවා ය.

21. ලං. ගැ. ජ.-2 -61 පිටුව
22. එම- 490 පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30

ඔවුන් සියලු දෙනා ම තමාට උදව් කරන බවට පොරොන්දු කරවාගත් කැටකිරිල්ල, ඉඩෝර කාලයක් එළඹුණු පසු ගෙම්බා සමීපයට ගොස් "යාළුවෙ, අද ඇතාට වතුර නැතුව එහෙමෙහෙ ඇවිද, ඇවිද වතුර හොයනවා. ඇතා කැරකෙන ඉසව්වේ පතහක් වගේ විලක් තියෙනවා. ඒ විලට ගිහින් හඬපන්. එතකොට 'හා ඒකෙ ඇත්තට ම වතුර තියෙනවා' කියල හිතල ඇතා එතෙන්ට ඒවි"[22] යනුවෙන් පවසන ලදුව, ගෙම්බා ද ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් ඇතා පතහට ඇද වැටුණේ ය. දෙවනුව ගොස් පතහෙ වැටී සිටින ඇතාගෙ ඇස් දෙක උගුල්ලගෙන ඌගෙ මුහුණෙ කිහිපපළකට ම හොටෙන් ඇනල වරෙන් යි' කැටකිරිල්ල කපුටාට පැවසුවා ය.

අනතුරුව මී මැස්සාට ඈ පැවරූ කාර්යය වූයේ ඇතාගෙ හිසට විද මරා දැමීමයි. මේ සියලු දෙනාගේ දායකත්වයෙන් කැලේ රජා යන විරුදය සහිත ඇතා මරා දැමුණු මේ කතාන්දරයෙන් පක්ෂියකු නොවන ගෙම්බා හා අනෙක් පක්ෂීන් එක්ව කැටකිරිල්ලගේ උපායට අනුව ක්‍රියාත්මක වීම මඟින් සමඟිය බලය වේ යන සංකල්පය මානව ප්‍රජාව වෙත සන්නිවේදනය කෙරේ. "මිටක් විතර ඇති ඒ කැට කිරිල්ලී- ඇතෙක් මැරෙව්වා හරිද කිරිල්ලී" යන ජනප්‍රවාදය ගොඩනැඟී ඇත්තේ මේ කතාප්‍රවෘත්තිය කේන්ද්‍රකරගෙන ය.

පාකර්ගේ ජනකතා එකතුවේ ඇතුළත් 'කුඹින් ගැන කතාන්දරය' මගින් ප්‍රකාශ වන්නේ කුඹියා සහ වඳුරා යන සත්ත්වයින් ආශ්‍රයෙන් ඇතැම් මනුෂ්‍ය ගතිපැවතුම් තිරිසන් සත්ත්වයන් අතර ද පවතින බව ය. එක්තරා රජවරයෙකුත් ඔහුගේ බිසවත් උක්ගස් කමින් සිටිනු දුටු නයි කුඹියෙක් තම භාර්යාවට උක්ගස් කන්න යන ලෙස ආරාධනා කරන ලදුව, ඔවුන් එතැනට ගොස් රජතුමා ආහාරයට ගෙන ඉවත ලූ උක්ගස් කුඹියාත් බිසව ආහාරයට ගෙන ඉවත ලූ උක්ගස් කුඹි භාර්යාවත් ආහාරයට ගනිමින් සිටින අතරතුර බඩපුරවා ගත් කුඹියා තම භාර්යාවට ආපසු යන්නට කතා කළ විට ඈ 'අනේ මට නම් තව මදි' යනුවෙන් ලබා දුන් පිළිතුරට "ගෑනු කොහොමත් බඩජාරියිනෙ. උන්ගෙ බඩගෙඩි ලොකුයි නෙ"[23] යනුවෙන් කුඹියා ලබාදුන් පිළිතුර ඇසුණු රජතුමා සිනා පහළ කෙළේ ය. බිසව සිනහවීමට කාරණය කිමෙක් දැ යි රජතුමාගෙන් ඇසුව ද ඔහු ඊට පිළිතුරු නො දුන්නේ ය. මේ කාරණය නැවත-නැවත අසමින් බිසව රජතුමාට කරදර කරනු දුටු ශක්‍රදේවේන්ද්‍රයා ඒ වනාන්තරයේ මොර ගෙඩි කකා සිටින අළු වඳුරෝ පන්සියයක් මවා මොරගෙඩි කන්නට නොහැකි යයි ඇවිටිලි කරමින් ගසේ ඉහළ ම අත්තක තිබූ කඩාගැනීමට අසීරු මොරගෙඩියක් කඩා දෙන්නැ යි මුරණ්ඩු වූ වැඳිරියට " පන්සියයක් දෙනාට මේවා කන්න පුළුවන්. ඇයි තිට විතරක් ඒවා කන්න බැරි?"[24] යි කියමින් කෝටුවක් අරගෙන වැරෙන් පහර දුන් පසු ඈ, 'මං මේවා කන්නම්' යයි වඳුරාට මෙල්ල වූවා ය. මෙය ඇසූ රජතුමා නැවතත් සිනහ පහළ කෙළේ ය. පසුදිනෙක 'ඔබතුමා අර එදා සිනාසුණේ මක්කට යැ' යි කියල කියන්නකෝ ' යනුවෙන් බිසව ඇවිටිලි කළ විට, "හිතන්න මොළයක් නැති මේ සත්තුත් උන්ගෙ බාරියාවන්ට බය නෑ. එහෙව් කොට මං බය වෙන්නෙ මක්කට යැ?"[25] යි කියමින් රජතුමා ඇගේ කොණ්ඩ ගැටෙන් අල්ලගෙන පහර දෙන්නට පටන් ගත්තේය. 'අනේ සාමිනේ මං ආයෙමත් ඒ ගැන අසන්නෙ නෑ' යනුවෙන් බැගෑපත් වූ බිසව ඉන්පසු රජතුමාට ඒ ආකාරයෙන් කරදරයක් නොවූවා ය.

22. එම- 490 පිටුව
23. ලං. ගැ. ජ.-2 -459 පිටුව
24. එම- 460 පිටුව
25. එම- 460 පිටුව

JOURNAL OF THE FACULTY OF HUMANITIES-30

මේ කතාවෙන් ප්‍රකාශිත විශේෂිත කාරණාව වන්නේ සමාජයේ පවත්නා පුරුෂාධිපත්‍යයේ ප්‍රබලතාව යි. කුමන කාර්යයක් වුව සිදු කළ යුත්තේ පුරුෂ පාර්ශ්වයේ අභිමතය අනුව බවත් කාන්තා පක්ෂයට ඒ පිළිබඳ ව ප්‍රශ්න කිරීමට අවසරයක් නොමැති බවත් මේ කතාවේ එන කුඹියාගේ හා වඳුරාගේ බිරින්දෑවරුන් සහ රජ බිසව මුහුණපාන සිද්ධිවලින් පැහැදිලි වේ. කාන්තාව සෑම විට ම පුරුෂාට අවනතව ජීවත් විය යුතුය යන සංකල්පය පිතෘමූලික සමාජවල ලක්ෂණයකි. ඒ අනුව මේ ජනකතාවේ සත්ත්ව බිරින්දෑවරුන්ට හා රජ බිසවට සිදුවන්නේ ද තම ස්වාමිපුරුෂයන්ගේ අණට අවනතව කටයුතු කිරීමට ය.

5. නිගමනය

සම්භාව්‍ය සාහිත්‍ය සේවනය කළෝ රජවරු, ප්‍රභූවරු හා විශේෂ වරප්‍රසාදලාභීහු ය. එහෙත් ජනසාහිත්‍ය සේවනය කරන්නෝ ද නිර්මාණය කරන්නෝ ද ගැමියෝ ය. ඒ අනුව, රටක වෙසෙන සාමාන්‍ය මිනිසුන් (ගැමියන්) ගේ මනෝභාව සහ ව්‍යවහාරික ජීවිතය පිළිබඳ යථාස්වරූපයෙන් තොරතුරු ගවේෂණය කළ හැකිවන්නේ සම්භාව්‍ය සාහිත්‍යයට වඩා ජනතාව විසින් ජනතාව උදෙසා නිර්මාණය වන හා ජනතාව ඇසුරේ භාවිත වන ජනසාහිත්‍යයෙනි. මේ පර්යේෂණය සඳහා භාවිත කෙරුණේ ජනසාහිත්‍යයට අයත් ප්‍රමුඛාංගයක් වන ජනකතා ය. මානව ප්‍රජාවට අයත් වන ස්ත්‍රී-පුරුෂයන් සතුව පවතින සටකපටකම්, ප්‍රේමය, විරහව, අකෘතඥභාවය, අමනෝඥභාවය, අන්තගාමී ස්වරූපය බඳු විවිධ පුද්ගල ගතිලක්ෂණ හා විවිධ චර්යාවන් පිළිබඳ ව ප්‍රකාශ කිරීම සඳහා ජනකතා නිර්මාණයේදී සිවුපා, පක්ෂි සහ උරග ආදි සත්ත්ව චරිත යොදා ගැනුණු ආකාරයත් ඒ ඔස්සේ මානව ජීවිතයේ විවිධ පැතිකඩ ස්පර්ශ කිරීමට උත්සුක වූ ආකාරයත් මේ පර්යේෂණයෙන් සසාධක ව තහවුරු කරගත හැකි විය. මේ අනුව, කතාන්දර කීම හා ඇසීම මඟින් මානවයාගේ ජීවිත පරිඥානය හා විඥානය පෘථුල කෙරෙන අතර ඔවුන් ලබාගන්නා විවිධවිෂයක අත්දැකීම්වල යථා ස්වරූපය පිළිබඳව ද පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි ය යන්න පැහැදිලි වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ආනන්ද, සුනිල් පී. ඒ., (2000). *සිංහල ජනශ්‍රැතිය හා සත්ත්ව ලෝකය.* කොළඹ. ගොඩගේ.

කරුණාරත්න, ආර්. එස් (2012). *ලක්දිව ගැමි ජනකතා.* කොළඹ. සූරිය ප්‍රකාශකයෝ.

උඩවත්ත, පියදාස., (2004). *වැව්ගම්පත්තුවේ ජනකතා.* කොළඹ. ගොඩගේ.

කුමාරසිංහ, සරත්චන්ද්‍ර., (2004). *දේවමැදිහත්පත්තුවේ ජනකතා,* කොළඹ. ගොඩගේ.

ගුණරත්න, ඒ. පී., (2005). *රන්කැකිර සහ තවත් කතා.* කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

ගුණරත්න, ඒ. පී., (2005). *නගුල් මුන්නා සහ තවත් කතා.* කොළඹ. ප්‍රකාශකයෝ.

ගුණසෝම, ගුණසේකර., (2002). *බිබිලේ ජනකතා.* කොළඹ. ගොඩගේ.

තුන්දෙණිය, එච්. එම්. එස්., (2000). *හෙළ ජනකතා.* මහරගම. තරංජී ප්‍රින්ටර්ස්.

දනන්සූරිය, ජිනදාස., (2002). *ජනශ්‍රැති අධ්‍යයන.* කොළඹ. ගොඩගේ.

දුනුමාල, මහානාම., (2003). *තුන් කෝරළයේ ජන කතා.* කර්තෘ ප්‍රකාශන.

රත්නපාල, නන්දසේන., (1995). ජනශ්‍රැති විද්‍යාව. කොළඹ. ගොඩගේ.

ලංකාවේ ගැමි ජනකතා පළමු වන වෙළුම - දෙවන මුද්‍රණය. (2014). පරිවර්තකඃ චන්ද්‍රශ්‍රී රණසිහ. කොළඹ. ගොඩගේ.

ලංකාවේ ගැමි ජනකතා - දෙවන වෙළුම (2012). පරිවර්තකඃ චන්ද්‍රශ්‍රී රණසිංහ. කොළඹ. ගොඩගේ.

වීරසිංහ, අමරදාස., (1986). *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම.* ගල්කිස්ස. සංස්කෘති ප්‍රකාශනය.

වීරසිංහ, අමරදාස., (2002). *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම.* කෙටි හැඳින්වීමක්. ගල්කිස්ස. ප්‍රකාශනඃ සංස්කෘති ආයතනය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-30

References

Micheal, Banton., (1969). *Anthrpological Approaches to the Study of Religion*. London. Tavistock Publications.

Bascom, William., (1965). *The Forms of Folklore.* prose Narratives. The Journal of American Folklore. Vol.78, No. 307(Jan-Mar), pp 3-20.

Eugenio, Damiana L., (1985). Phillippine Folktales: *An Introduction. Asian Folklore Studies*. Vol.44, No. 02, Published by Asian Folklore Studies: Nanzan University, pp 155-177.

Sanker, Sengupta., (1963). *Folklore Research in India.* Reception Committee of all Indian Folklore Confernces.

Ronald. J. Berger and Richard. Quinney., (2005). *Storytelling Sociology*. United Ststes of America. EdLynne Rienner Publishes.